# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** 011 7920950, 0117920951**Fax:** 011 7920949
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


2010 පාර්ලිමේන්තු මහ මැතිවරණය

මාධ්‍ය නිවේදනය අංක 01

2010 මාර්තු 19 වන දින, පෙරවරු 10.00ට

මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය දේපල වැරදි ලෙස භාවිතය සහ ගිනි අවි භාවිතය සහිත ප්‍රචන්ඩ ක්‍රියාවන ගේ ඉහළ යාම පිළිබඳ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ.ප්‍ර.නි.ම) සිය දැඩි අවධානය යොමු කර සිටී.

## ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ විමසුම

පාර්ලිමේන්තු මැතිවරණය සඳහා නාම යෝජනා භාර ගැනීම අවසන් වු පෙබරවාරි 26 වැනි දින සිට 2010 මාර්තු මස 18 වන දින තෙක් මැ.ප්‍ර.නි.මට වාර්තා වී තහවුරු කරගත් සමස්ථ සිද්ධි සංඛ්‍යාව 115 කි. ඉන් සිද්ධි 75 ක් (65%) ක් බරපතල සිද්ධීන් ලෙස හඳුනා ගෙන ඇති අතර, ඉන් සිද්ධි 25 (33%) ක්ම රාජ්‍ය දේපල මැතිවරණ ප්‍රචාරක ක්‍රියාවලියට යොදා ගැනීම සම්බන්ධව වේ.

ගිනි අවි භාවිතය පිළිබඳ සිද්ධීන් 18 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එය සමස්ථ බරපතල සිද්ධි සංඛයෙන් 25% කි.

තහවුරු කරගත් බරපතල සිද්ධීන් 75 තුළ, තුවාල කිරීම් 6 ක්, බරපතල තුවාල කිරීම් 3ක්, පහරදීම් 22 ක් තර්ජනය කර බිය ගැන්වීම් 14 ක්, රාජ්‍ය දේපල අයථා පරිහරණයන් 25 ක් සහ ගිනි තැබීම් 5 ක් අන්තර්ගතවේ.

## රාජ්‍ය දේපල මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට යොදා ගැනීම

මැ.ප්‍ර.නි.මට රාජ්‍ය දේපල අයථා පරිහරණය පිළිබඳ සිද්ධීන් 6 ක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්ථා වී ඇත. ඉන් සිද්ධීන් 3 ක දී දැනට අමාත්‍ය ධූරය දරණ ජාතිය ගොඩනැගීමේ අමාත්‍ය එ.ජ.නි.ස අපේක්ෂක සාලින්ද දිසානායක සහ ඔහුගේ ආධාරකරුවන් විසින් අංක 252-6010,WP HL 2766 සහ WP PB 2271 දරණ කැබ් රථ සහ අංක 0114945974 දරණ සී.ඩී.එම්.ඒ දුරකථන භාවිතය පිළිබඳ චෝදනා එල්ල වී ඇත. මේ සම්බන්ධව මැ.ප්‍ර.නි.ම සාලින්ද දිසානායක ඇමතිවරයාගෙන් විමසීමට දැරූ උත්සාහයන් ගණනාවක් ම අසාර්ථක විය.

එ.ජ.නි.ස. අපේක්ෂක තාරානාත් බස්නායක ( අංක 15 ) විසින් හමුදා සොල්දාදුවන් ගේ සුභසාධන කටයුතු සඳහා ඉදිකර ඇති ගල්ගමුවේ පිහිටි ගොඩනැගිල්ල පක්ෂ කාර්යාලයක් ලෙස භාවිතා කිරීම පිළිබඳ මැ.ප්‍ර.නි.මට වාර්තා වී ඇත.

මේ පිළිබඳව මැ.ප්‍ර.නි.ම ගල්ගමුව ප්‍රදේශීය ලේකම් කාර්යාලයෙන් විසූ විට නම හෙළි කිරීමට අකමැති එහි නිළධාරියකු ප්‍රකාශ කර සිටියේ මෙම සිද්ධිය සත්‍ය බවත් සහ මෙම ගොඩනැගිල්ල වර්තමානයේ  ගල්ගමුව ග්‍රාම සංවර්ධන සමිතියෙන් පාලනය වන බවත් ය.

නුවරඑළිය පිහිටි කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක පශු සම්පත් සංවර්ධන අමාත්‍ය හා එ.ජ.නි.ස අපේක්ෂක (අංක 02) සී.බී රත්නායක විසින් සිය ප්‍රචාරක කරයාලයේ පවත්වා ගෙන යනු ලබයි.

මාර්තු 18 වන දින මැ.ප්‍ර.නි.ම විසින් නුවරඑළිය කළාප අධ්‍යාපන කාර්යාලයෙන් විමසන ලදි. එහිදී නම හෙළි කිරීමට අකමැති නිළධාරියකු ප්‍රකාශ කරන ලද්දේ දෙපාර්තමේන්තුවට අයත් පැරණි ගොඩනැගිල්ලේ සී.බී රත්නායන විසින් පශු සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ උප කාර්යාලයක් පවත්වා ගෙන යන බවයි. මැ.ප්‍ර.නි.ම විසින් අමාත්‍ය සී.බී.රත්නායක ගෙන් මේ පිළිබඳ විමසූ විට ඔහු එම චෝදනා ප්‍රතික්ශේෂ කරන ලදි.

සබරගමුව පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරණු ලබන මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියට අයත් WPJL 5264 දරණ කැබ් රථය අයථා ලෙස පරිහරණය කිරීම පිළිබඳව මැ.ප්‍ර.නි.ම වෙත වාර්තාවක් ලැබී ඇත. ඒ අනුව එම කැබ් රථය එ.ජ.නි.ස අපේක්ෂක (අංක 4) කනක හේරත්ගේ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා කරමින් පවති.

මැ.ප්‍ර.නිම. විසින් විසින් සබරගමුව ප්‍රධාන අමත්‍ය කාර්යාලයෙන් මේ පිළිබඳව විමසන ලදි. පලාත් සභාවේ නිලධාරියකු ප්‍රකාශ කළේ එම වාහනය ජාත්‍යන්තර සහයෝගිතාව සඳහාවන ජපාන බැංකුව විසින් ඔවුන්ගේ ව්‍යාපෘති කාර්යාලය සඳහා ලබා දී ඇති බවයි. ඒ හැර ඔවුන් එම වාහන පිළිබඳ කිසිදු විස්තරයක් නොදන්නා බව පැවසිය

මාර්තු 18 වන දින මැ.ප්‍ර.නි.ම විසින් කනක හේරත් ගෙන් මේ පිළිබඳව විමසූ අතර ඔහු එම චෝදනාව සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කරන ලදි.

මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරික්ෂණයට අනුව 2010 මාර්තු 18 වන දින කෘෂිකර්ම සංවර්ධන හා කෘෂිකර්ම සේවා අමාත්‍ය හා එ.ජ.නි.ස අපේක්ෂක මෛත්‍රිපාල සිරිසේන (අංක 07) මහතාගේ ප්‍රචාරක පුවරුසෙවන පිටියේ සිට වැලිකන්ද දක්වා ප්‍රදර්ශනය කිරීම සඳහා මහවැලි අධිකාරියට අයත් අංක 52-2425 දරන මිට්ෂුබිෂි කැබ්රථය යොදා ගෙන ඇත.

මේ පිළිබඳව මැ.ප්‍ර.නි.ම පොළොන්නරුව මහවැලි නේවාසික ව්‍යාපෘති කළමනාකරුගෙන් විමසූ විට ප්‍රකාශ කළේ එම වාහනය මහවැලි අධිකාරියට අයත් බව සහ මෙවැනි සිද්ධියක් පිළිබඳව තමා නොදන්නා බවයි.

## එකම පක්ෂය තුළ සිදුවන ප්‍රචණ්ඩක්‍රියා ඉහල යෑම

මනාප තරගය නිසා එකම පක්ෂය තුළ සිදුවන ගැටුම් ඉහළ යෑමේ ප්‍රවණතාවක් මතුවෙමින් පවති. එ.ජ.නි.සයට එරෙහිව පැමිණිලි 91 න් 23 (25%) ම ලැබී ඇත්තේ පක්ෂයේම ආධාරකරුවන් ගෙනි. එකම පක්ෂය තුල සිදුවන ප්‍රචන්ඩ ක්‍රියාවන් 5 ක් සිදු වී ඇත්තේ දකුණු පළාතෙනි. සබරගමුව පලාතේ සිදුව ඇති බරපතල සිදුවීම් 12 න් සිදුවීම් 5 ක ගිනි අවි භාවිතා වී ඇත. නැගෙනහිර පළාතේ සිදුවීම් 3ක් ද  උතුරු මැද පළාතෙන් සිදුවීම් 02 ක් ද මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇත.

මැ.ප්‍ර.නි.ම.ට වාර්තාවූ ආසන්නතම ගිනි අවි භාවිතය පිළිබඳ සිද්ධිය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා විය.

මාර්තු 17 වන දින පස්වරු 10.30ට පමණ එ.ජ.නි.ස අපේක්ෂක ආර්.ඩී.විමලදාසගේ (අංකය 06) ආධාරකරුවන් පිරිසක් විසින් එ.ජා.ප අපේක්ෂක නිල්වලා විජේසිංහ මහතාගේ ආධාරකරුවන් පිරිසකට

රිදිගම පිහිටි ඔහුගේ නිවස අසලදී පහරදී ඇත. පහරදුන් පිරිස සුදු පැහැති කැන්ටර් රථයකින් පැමිණ ඇත. එ.ජා.ප ආධාරකරුවන් පිරිස පහරදීමට ලක්වන විට රාත්‍රී ආහාර ගනිමින් සිට ඇත. පහරදීමෙන් පසු එ.ජා.ප ආධාරකරුවන් 5 දෙනකු තුවාල ලබා කුරුණෑගල මහරෝහලට ඇතුලත් කර තිබේ.

මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරීක්ෂක මාර්තු 18 වන දින කුරුණෑගල මහ රෝහලට ගොස් පහර කෑමට ලක් වූ අයත් ප්‍රකාශ සටහන් කරගෙන තිබේ. එ.ජා.ප. ආධාරකරුවකු වන අනුර මුණසිංහ ඔහුට ප්‍රකා කර ඇත්තේ විත්තිකරුවන් ඔවුන්ට ලී පොලු වලින් පහර දුන් අතර අසල සිටි එ.ජා.ප ආධාරකරුවන් එය වැළැක්වීමට උත්සාහ දැරූ බවයි. එම අවස්ථාවේ පහරදුන් පිරිස විසින් අහසට වෙඩි තබා ඇත. එම වෙඩි තැබීමකින් අසල සිටියකුගේ හිසට සුලු තුවාල සිදුවී ඇත.

මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරීක්ෂකට අනුව රිදිගම පොලිසිය මේ සිදුවීම සනාථ කර ඇති අතර ඔවුන් තවදුරටත් එම සිදුවීම පිළිබඳව විමර්ශන පවත්වයි.

මැ.ප්‍ර.නි.ම සියලුම දේශපාලන පක්ෂවලින් විශේෂයෙන්ම වැඩිම මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩක්‍රියා සංඛ්‍යාවක් සඳහා චෝදනා ලැබූ පාලක සන්ධානයෙන් ඉල්ලා සිටින්නේ, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට හා මැතිවරණ ක්‍රියාපටිපාටියේ විනිවිදභාවයට පැහැදිලි තර්ජනයක් වන ජන්ද අපේක්ෂකයින්ගේ හා ඔවුන්ගේ ආධාරකරුවන් ගේ ප්‍රචණ්ඩක්‍රියාවන් වැළැක්වීමට ඉක්මන් සහ ප්‍රතිඵලදායි පියවර ගන්නා ලෙසයි.

මැතිවරණ ගණනාවක් සම්බන්ධයෙන් මැ.ප්‍ර.නි.මට ඇති අත්දැකීම් අනුව පූර්ව මැතිවරණ සමයේ සිදුකරන ප්‍රචණ්ඩක්‍රියා බැලූ බැල්මට ප්‍රචණ්ඩත්වයෙන් තොර නමුත් පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරතවුවන්ගේ වාසිය සඳහා හේතුවන මැතිවරණ දිනයක් ඇති වීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කරනු ඇත. එසේ හෙයින් පූර්ව මැතිවරණ සමයේ සිදු කරන ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සහ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට චෝදනා ලබන්නන්ට දඬුවම් ලබාදීම මැතිවරණ ක්‍රියාවලියේ විනිවිදභාවය සඳහා අනිවාර්යය අවශ්‍යතාවක් වේ.

මෙම තත්ත්වය හමුවේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පූර්ව වශයෙන් ක්‍රියාත්මක කිරීමේ අනිවාර්ය වැදගත්කම මැ.ප්‍ර.නි.ම යළි යළිත් ප්‍රකාශ කර සිටී. මැතිවරණයේ සුපිරිසිදු බව ආරක්ෂා කිරීම සඳහා 17 වන සංශෝධනයේ සඳහන් පොලිසිය, රාජ්‍ය සේවය හා මැතිවරණ සඳහා ස්වාධීන කොමිසන් සභා ගෙන ඒම අනිවාර්යය අවශ්‍යතාවක් බව මැ.ප්‍ර.නි.ම විශ්වාස කරයි.

මැ.ප්‍ර.නි.ම එලැඹෙන පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දැනටමත් ක්ෂේත්‍ර නිරීක්ෂකයින් 180 ක් යොදවා නිරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. මැතිවරණ දිනයේදී ජන්ද මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 4,500 ක් හා ජංගම නිරීක්ෂණ රථ 50 ක් යොදවමින් නිරීක්ෂණය කරනු ලබයි.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාත සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |